# සෙනසුරාදා

## පළමුවන කියැවීම

එසකියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

එසෙකියෙල් **37 : 21–28**

**මම ඔවුන් සැම එක් ජනතාවක් බවට පත් කරන්නෙමි.**

මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරණ සේක. “ඉශ්‍රායෙල් සෙනග ගොස් සිටින තැන්වල විජාතීන් අතරෙන් මම ඔවුන් රැගෙන වටින් පිටින් ඔවුන් රැස් කොට, ඔවුන්ගේ රටට ඔවුන් පමුණුවන්නෙමි. මම දේශයෙන් ඉශ්‍රායෙල් කඳු පිට ඔවුන් එක් ජාතියක් කරන්නෙමි. එක රජෙක් ද ඔවුන් සියල්ලන්ටම රජ වන්නේය. ඔව්හු තවත් ජාති දෙකක් නොවන්නෝය. තවත් රාජ්‍යයන් දෙකකට නොබෙදෙන්නෝ ය. ඔව්හු තමන්ගේ දේව රූපවලින් වත්, තමන්ගේ පිළිකුල් ක්‍රියාවලින් වත් තමන්ගේ සියලුම පාප ක්‍රියාවලින් වත් තමන් කිළුටු කර නොගනිති. ඔවුන් කළ පව් වලින් මම ඔවුන් ගළවා පිරිසිදු කරන්නෙමි. ඔව්හු මාගේ සෙනග වන්නෝය. මම ද ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි. මාගේ සේවක දාවිත් වැනි රජෙක් ඔවුන් කෙරෙහි රජ වන්නේය. ඔවුන් සියල්ලන්ටම එක එඬේරෙක් වන්නේය. ඔව්හු මාගේ නියෝග ලෙස හැසිර, මාගේ පණත් අනුසාර කර ඒවා ඉටු කරන්නෝය. මාගේ සේවක ජාකොබ්ට මා දුන් නුඹලාගේ පියවරුන් වාසය කළ දේශයෙහි ඔවුන් වාසය කරනු ඇත. එසේ ඔව්හු ද ඔවුන්ගේ දරුවෝ ද ඔවුන්ගේ දරුවන්ගේ දරුවෝ ද සදාකාලයටම එහි වාසය කරන්නෝය. මාගේ සේවක දාවිත් වැනි රජෙක් සදාකාලයට ම ඔවුන්ට අධිපතියා වන්නෝය. තවද මම සාමදාන ගිවිසුමක් ඔවුන් සමග කරන්නෙමි. එය ඔවුන් සමග සදාකාල ගිවිසුමක්

වන්නේය. මම ඔවුන්ට ආසිරි පතා, ඔවුන් වැඩි වර්ධනය කොට, මාගේ ශුද්ධස්ථානය ඔවුන් අතරෙහි සදාකාලයටම පිහිටුවන්නෙමි. මම ඔවුන් සමග වැඩ වසන්නෙමි. මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි. ඔව්හු මාගේ සෙනඟ වන්නෝය. මාගේ ශුද්ධස්ථානය සෑම කල්හි ම ඔවුන් අතර තිබීමෙන් මා ඉශ්රායෙල් විශුද්ධ කරන ස්වාමින් වහන්සේ බව විජාතීන් දැනගනු ඇත.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **31 : 10 – 13**

පිළිතුර: එඬේරා තම රැළ රැකගන්නාක් මෙන් සමිඳාණෝ අප රැකගන්නා සේක.

ගීය:

එම්බා ජාතීනි, සමිඳුන්ගේ වචනයට සවන් දී දුර බැහැර දිවයින්වල එය ප්‍රකාශ කරන්න. 'ඉශ්රායෙල් සෙනග විසිර වූ මම ඔවුන් රැස් කරන්නෙමි. එඬේරා තම රැළ රැකගන්න පරිදි මම ඔවුන් රැකගන්නෙමි'යි කියන්න.

ඉශ්රායෙල් සෙනගට නිදහස දී බලවත් ජාතීන්ගේ හස්තයෙන් මම ඔවුන් ගළවා ගතිමි. ඔව්හු පැමිණ සියොන් කන්ද මත ප්‍රීතියෙන් ගී ගයති. මාගේ යහපත්කම නිසා තමන් ලද දීමනා වන ධාන්‍ය, මිදියුස හා තෙල් ද බැටළු පැටවුන් හා ගව වස්සන් ද ගැන සතුටු වන්නෝය. ඔවුන්ගේ ජීවිතය ජලයෙන් සාරවත් වූ උයනක් මෙන් වන්නේය. ඔව්හු තවත් කිසි සේත් දුක් නොවන්නෝය.

එවිට තරුණියෝ ප්‍රීතියෙන් නටන්නෝ ය. තරුණයෝ ද මහල්ලෝ ද එක්ව ප්‍රීති වන්නෝය. මම ඔවුන්ගේ වැළපීම ප්‍රීතියට හරවන්නෙමි. ඔවුන් සනසා ඔවුන්ගේ දොම්නස සොම්නසට හරවන්නෙමි.

## සාධුකාරය

දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත් ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම නොමැරී සදාතන ජීවනය ලබන්නේය.

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 11 : 45 – 57

***විසිරී සිටින දේව දරුවන් එක් රැස් කරන පිණිස උන් වහන්සේ දිවි පිදිය යුතුය.***

මරියා වෙතට ආ ජුදෙව්වරුන්ගෙන් බොහෝ දෙනෙක් ජේසුස් වහන්සේ කළ දේ දැක උන් වහන්සේ අදහා ගත්හ. එහෙත් ඔවුන්ගෙන් ඇතැමෙක් පරිසිවරුන් වෙත ගොස් ජේසුස් වහන්සේ කළ දේවල් ඔවුන් සැල කළහ.

එවිට නායක පූජකයෝ ද, පරිසිවරු ද ශ්‍රේෂ්ඨාධිකරණය රැස් කරවා, ‘අපි කුමක් කරමු ද? මේ මිනිසා බොහෝ හාස්කම් කරයි. අප ඔහුට මෙසේ ඉඩ හැරියොත් සියල්ලන්ම ඔහු අදහා ගනු ඇත. එවිට රෝමවරුන් පැමිණ අපේ ශුද්ධස්ථානයත්, අපේ ජාතියත් වනසනු ඇතැ”යි කීහ.

ඔවුන්ගෙන් එක්කෙනෙක් වූ ඒ අවුරුද්දේ නායක පූජක වූ කායාපාස් කතා කොට, “ඔබ දන්නා දෙයක් නැත. මුළු ජාතියේ විනාශයට වඩා ජනතාව උදෙසා එක මිනිසෙකු ගේ මරණය යෝග්‍ය බව ඔබට තේරෙන්නේ නැතැ”යි කීය. මෙය ඔහුම හිතා මතා කී දෙයක් නොවේ. ඒ වනාහි ඒ අවුරුද්දට ඔහු උත්තම පූජකයා ව සිටි බැවින් ජේසුස් වහන්සේ ජාතිය උදෙසා ද, ජාතිය උදෙසා පමණක් නොව, දෙවියන් වහන්සේගේ විසිරී ගිය දරුවන් එක් රැස් කරන පිණිස ද දිවි පිදිය යුතු බවට ඔහු පැවසූ දිවැසි කීමකි. එබැවින් එදා පටන් ඔව්හු උන් වහන්සේ මරන්නට කුමන්ත්‍රණය කළහ.

ඒ නිසා ජේසුස් වහන්සේ ජුදෙව්වරුන් අතරෙහි තවත් ප්‍රසිද්ධියේ නොගැවසී, එයින් ඉවත්ව පාළුකරයට යාබද පෙදෙසෙහි ඒප්‍රායිම් නම් නුවරට වැඩමකර ශ්‍රාවකයන් සමග එහි නැවතී සිටි සේක.

එකල ජුදෙව්වරුන්ගේ පාස්කු මංගල්‍යය ළංව තිබිණි. මංගල්‍යයට තම තමන් පවිත්‍ර කර ගන්නා පිණිස බොහෝ දෙනෙක් පිටිසරින් තික්ම ජෙරුසලමට ගියහ. එවිට ඔව්හු ජේසුස් වහන්සේ සොයමින් දේව මාලිගයේ සිටිය දී ඔබ කුමක් සිතන්නහු ද? ඔහු මංගල්‍යයට නැවිත් සිටී දැ"යි ඔවුනොවුන් අතර කතා කර ගත්හ. උන් වහන්සේ සිටින තැන යමෙක් දනිතොත් අත් අඩංගුවට ගන්නා පිණිස ඒ බව දන්වන මෙන් නායක පූජකයන් ද පරිසිවරුන් ද අණ දී තිබිණි.

සුවිශේෂ වාක්‍යය එසේ ය.